# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2478/52 - 2026 මාර්තු මස 06 වැනි සිකුරාදා - 2026.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : AKU/LAN/06/LA/70.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/8/2016/PC/547.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළය උතුර අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිගනහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දිගනහේන ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ ක. සි. අංක 820487හි කලාප අංක 2හි පත්‍ර අංක 1 දරන පිඹුරේ පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම :

01. **කැබලි අංකය 1**
ඉඩමේ නම: අලුත්හේන; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0269.

මායිම්

*උතුරට* : අ. ග. පි. 535හි කැබලි අංක 922; *නැගෙනහිරට* : අ. ග. පි. 535හි කැබලි අංක 922; *දකුණට* : අ. ග. පි. 535හි කැබලි අංක 256 E සහ මෙම පිඹුරේ කැබලි අංක 2; *බටහිරට* : මෙම පිඹුරේ කැබලි අංක 2 සහ අ. ග. පි. 535හි කැබලි අංක 922.

02. **කැබලි අංකය 2**
ඉඩමේ නම: අලුත්හේන; හිමිකම් කියන අය: නමුණුකුල වතු සමාගම; ප්‍රමාණය: හෙක්. 0.0743.

මායිම්

*උතුරට* : කැබලි අංක 1 සහ අ. ග. පි. 535හි කැබලි අංක 922; *නැගෙනහිරට* : අ. ග. පි. 535හි කැබලි අංක 256 E ; *දකුණට* : අ. ග. පි. 535හි කැබලි අංක 256 E සහ මාර්ගය; *බටහිරට* : අ. ග. පි. 535හි කැබලි අංක 922.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2026 අප්‍රේල් මස 27 දින පෙ. ව. 09.30ට** අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026 අප්‍රේල් මස 20 දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියලු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

**කේ. ජී. ඩී. අනෝජා,**
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2026 පෙබරවාරි මස 27 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0059

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙරමාන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැනුම්පති විසින් මැන පිළියෙල කරන ලද නු 3095 දරන පිඹුරේ කැබැලි අංක 01 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4197ක් වන කලුගලමාන නම් ඉඩම් කොටසේ විස්තර :

**01. නු 3095 දරන පිඹුරේ කැබැලි අංක 01**
ඉඩමේ නම: කලුගලමාන; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: විජේබාහුකන්ද අභයවර්ධනාරාම විහාරස්ථාන භාරකාර පූජ්‍ය දිඹුලේ උඩගම ශ්‍රී රත්නපාල සෝභිත නායක හිමි; ප්‍රමාණය: හෙක්. 0.4197.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2026 අප්‍රේල් මස 29 දින පෙ. ව. 10.00**ට කොත්මලේ බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026 අප්‍රේල් මස 22 වැනි දිනට මත්තෙන් ඒ, ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එච්. එම්. එස්. කේ. කේ. හේරත්,**
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ බටහිර.

2026 පෙබරවාරි මස 26 වැනි දින,
කොත්මලේ බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0060

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : AKU/LAN/06/LA/93.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/5/2020/HA/42.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තර* :

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළය උතුර අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විලගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ විලගම ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ ක. සි. අංක 820500 හි කලාප අංක 03හි පත්‍ර අංක 01 දරන පිඹුරේ පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම:

**01. කැබැලි අංක 01**
ඉඩමේ නම: අමරසිංගේවිල; ප්‍රමාණය: හෙක්. 0.0126.

මායිම්

උතුරට: අ. ග.පි. 532හි කැබලි අංක 135 සහ ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ අ.ග.පි. 532හි කැබලි අංක 110 E ; බටහිරට: අ.ග.පි. 532හි කැබලි අංක 110, E 110 සහ 135.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2026 අප්‍රේල් මස 27 දින පෙ. ව. 10.30**ට අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026 අප්‍රේල් මස 20 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල් ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියලු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

**කේ. ජී. ඩී. අනෝජා,**
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2026 පෙබරවාරි මස 27 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0061

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.